කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර )-2011

2013 අගෝස්තු /සැප්තැම්බර්

**BCOM E 4015 - උපායමාර්ගික කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

---

01. අ. උපාය මාර්ගික කළමනාකරණයේ වාසි පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. උපාය මාර්ගික කළමනාකරණයට ඇති අභියෝගයන් සාකච්ඡා කරන්න.

(ලකුණු 07)

ඇ. ඉගෙනුම් සංවිධානයක් (Learning organization) යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක්ද ? විස්තර කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

02. අ. පරිසර විශ්ලේෂණයේ වැදගත් විචල්‍යයන් කෙරෙහි අවධානය යොමු කරමින් පරිසර විශ්ලේෂණයේ ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

ආ. ඔබ කැමති ඕනෑම කර්මාන්තයක් භාවිතා කරමින් කර්මාන්තයක තරඟකාරි තීව්‍රතා මට්ටම විශ්ලේෂණය කිරීම සඳහා පෝටර්ගේ පංච බලවේග (five forces) ආකෘතිය යොදා ගත හැක්කේ කෙසේද යන්න පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. අ. " පිරිවැය නායකත්ව උපාය මාර්ගය " ( Cost leadership Strategy ) විභේදන උපායමාර්ගයෙන් ( Differentiation Strategy) වෙනස් වන්නේ කෙසේද ?

(ලකුණු 05)

ආ. බොහෝ උපායමාර්ගික සංධාන (Strategic Alliances) තාවකාලික ඒවා වන්නේ මන්ද ?

(ලකුණු 05)

ඇ. යම් කිසි කර්මාන්තයකට පළමුව ඇතුල්වීමේ වාසි සහ අවාසි මොනවාද ? සුදුසු උදාහරණ සමගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04. අ. සංවිධාන උපායමාර්ගයක් ලෙස තිරස් වර්ධනය සිරස් වර්ධනයෙන් වෙනස් වන්නේ කෙසේද ?

(ලකුණු 05)

ආ. වරලත් ව්‍යාපාර සහ අත්පත් කර ගැනීම් අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. පහත සඳහන් උපාය මාර්ගයන් කෙටියෙන් පැහැදිලි කරන්න.

i. විවිධාංගිකරණ උපායමාර්ග

ii. ස්ථාවරත්ව උපාය මාර්ග

iii. වියදම් අඩුකිරීමේ උපායමාර්ග

(ලකුණු 3x3=09)

(මුළු ලකුණු 20)

05. අ. " ශ්‍රිතික උපායමාර්ගයන් අනෙකුත් ශ්‍රිතයන්ගෙන් ස්වාධීන වේ." මෙම ප්‍රකාශය හා ඔබ එකඟ වන්නේද ? ඔබේ පිළිතුර සුදුසු උදාහරණ සමගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

ආ. උපාය මාර්ගික කළමනාකරණයේදී සංවිධාන සංස්කෘතියේ කාර්යභාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. අ. හැසිරීම් පාලනයන් සහ ප්‍රතිදාන පාලනයන් අතර වෙනස පැහැදිලි කරන්න.

(ලකුණු 05)

ආ. " සංවිධාන ව්‍යුහය උපායමාර්ග ලුහුබඳී. " ඔබ එකඟ වන්නේද ? පැහැදිලි කරන්න.

(ලකුණු 07)

ඇ. උපාය මාර්ගික ඇගයීමේදී සහ පාලනයේදී උපාය මාර්ගික තොරතුරු පද්ධති වල ඇති කාර්යභාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

(මුළු ලකුණු 20)

07. පහත සඳහන් ඒවා පිළිබඳ කෙටි සටහන් ලියන්න.

අ. උපාය මාර්ගික සාධාන

ආ. න්‍යාස සංවිධාන ව්‍යුහය

ඇ. තුලිත පත්‍රය (Balanced Scorecard)

ඈ. වත්මන් සමාජ සංස්කෘතික ප්‍රවනතා

(මුළු ලකුණු 20)